(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **57.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ජනවාරි 19 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **ලලිත් වර්ණ කුමාර මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **කරුණාදාස කොඩිතුවක්කු මහතා**

ගරු **නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**

ගරු **මනෝ ගනේෂන් මහතා**

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

**ගරු  ජගත් සමරවික්‍රම මහතා**

**ගරු  රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු  මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු  ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු  ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු  (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු  නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු  විජිත හේරත් මහතා**

**ගරු  සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු  මර්ජාන් ෆලීල් මහතා**

**ගරු  ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXIX කොටස;

(ii) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIV කොටස, තෙවැනි කාණ්ඩයේ XVIII, නවවැනි කාණ්ඩයේ XXXV සහ XXXVI කොටස්;

(iii) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLII හා XLIII කොටස්, සහ තෙවැනි කාණ්ඩයේ XVI හා XVII කොටස්;

(iv) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIX, XL හා XLI කොටස්, තෙවැනි කාණ්ඩයේ XIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XXIX, XXX, XXXI, XXXII හා XXXIII කොටස්; සහ

(v) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XX, XXI, XXII, XXIII, XXIV, XXV,XXVI හා XXVII කොටස්, තෙවැනි කාණ්ඩයේ XI, XII හා XIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ XIV, XV, XVI, XVII, XVIII, XIX හා XX කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 12.25 ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 1.59 ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 4.07 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.45 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යටතේ පවත්වනු ලබන සෑම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 22 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"3. (1) 2 වන වගන්තියේ නිශ්චිත දක්වා ඇති යම් නීතියක් යටතේ මැතිවරණයක් පවත්වන ලෙස නියම කරමින් කරන ලද ප්‍රකාශනයේ හෝ නියමයේ නිශ්චිතව දක්වා ඇති නාමයෝජනා භාරදීමේ කාලසීමාව අවසන් වීමෙන් පසුව දින පහක කාලයක් ඇතුළත, මැතිවරණ කොමිෂන් සභාව විසින්, ඒ මැතිවරණයට තරඟ කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විමසා, ඒ මැතිවරණය සඳහා වන අවසරලත් මුදල, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණනය කිරීමේ කාර්ය සඳහා භාවිතයට ගැනීමට ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් ශ්‍රී ලංකා රුපියල්වලින් යම් මුදලක් තීරණය කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, ජනාධිපතිවරණයක් සම්බන්ධයෙන් වන විට, දේශපාලන පක්ෂයක් විසින් නම් කරනු නොලැබූ සෑම අපේක්ෂකයයෙක් ම විමසිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලබන මුදල ගණනය කිරීමේ දී, ශ්‍රී ලංකාවේ පවත්නා උද්ධමන අනුපාතය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 3 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(3) අපේක්ෂකයකු සම්බන්ධයෙන් වන විට, අවසරලත් මුදල පහත";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ මැතිවරණය සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකින්, අපේක්ෂකයා තරඟ කරනු ලබන පළාත් පාලන ආයතනයේ ඡන්ද කොට්ඨාසයේ ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ මැතිවරණය සඳහා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කරනු ලබන මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 31 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වනවිට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ මැතිවරණය සඳහා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මුදලකින්, දිවයිනේම මැතිවරණ කොට්ඨාසවල ලියාපදිංචි";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 3 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(4) පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සම්බන්ධයෙන් වන විට, අවසරලත් මුදල තීරණය කිරීමේ දී, (1) වන උපවගන්තියේ සඳහන් මුදල, 2 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන මැතිවරණයකට තරඟ කරනු ලබන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් වල, අවස්ථාවෝචිත පරිදි

පළාත් පාලන ඡන්ද විමසීම් බල ප්‍රදේශයේ හෝ පරිපාලන දිස්ත්‍රික්කයේ හෝ මැතිවරණ කොට්ඨාසයේ හෝ දිවයිනේම මැතිවරණ කොට්ඨාසවල ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව සහ එම පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් එම මැතිවරණයට තරඟ කිරීම සඳහා නම් කරනු ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 4 වැනි පේළිය සහ 5 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(5). (3) වන සහ (4) උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව ගණනය කරන ලද අවසරලත් මුදල, (1) වන උපවගන්තිය යටතේ වන නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ දී ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 5 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(6). (1) වන උපවගන්තියේ සඳහන් විමසීම් ක්‍රියාවලිය, මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ තේරීම් භාර නිලධාරින් හරහා කරනු ලැබිය හැකි ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 6 වැනි පේළියේ සිට 9 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''4. (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන මැතිවරණයක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් සහ අපේක්ෂකයෙක් විසින් ඒ මැතිවරණයට අදාලව අවස්ථාවෝචිත පරිදි 3 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් අවසරලත් මුදල් ඉක්මවා වියදම් දැරීම නොකළ යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) යම් මැතිවරණයකට අදාලව 3 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අවසරලත් මුදල ඉක්මවා යම් අපේක්ෂකයකු වියදම් සිදුකරනු ලබන අවස්ථාවක දී, 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නීතියක අර්ථානුකූලව පවත්වන ලද එවැනි යම්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 4 වැනි වගන්තියේ පැති සටහන ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් සහ අපේක්ෂකයකු විසින් සිදුකරනු ලබන මැතිවරණ වියදම් සීමා කිරීම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 21 වැනි පේළිය සහ 22 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යටතේ පවත්වනු ලබන මැතිරණයක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් සහ අපේක්ෂකයකු විසින් -";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 23 වැනි පේළිය සහ 24 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ යම් කොටස් ප්‍රමාණයක් රජය විසින් හෝ රාජ්‍ය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 9 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ, ස්වාධීන කණ්ඩායමේ හෝ අපේක්ෂකයාගේ මැතිවරණය ප්‍රවර්ධනය කිරීමේ හෝ ඊට ඉඩ සැලසීමේ කාර්යය සඳහා මුදලින් හෝ ද්‍රව්‍යමය ආකාරයකින් ඍජුව හෝ වක්‍රව ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් ලැබුණ ද ඒ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යම් අපේක්ෂකයකු ඒ මැතිවරණය පවත්වන ලද";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"6. (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන මැතිවරණයක සෑම පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් සහ අපේක්ෂකයකු විසින් ම, ඒ මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කළ දින සිට දින විසි එකක් ඇතුළත, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ, ස්වාධීන කණ්ඩායමේ හෝ අපේක්ෂකයාගේ මැතිවරණය ප්‍රවර්ධනය කිරීම හෝ ඊට ඉඩ සැලසීම සඳහා -

(අ) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගත් හෝ භාරගත් සියලු පරිත්‍යාග හෝ දායකත්ව පිළිබඳ වාර්තාවක්, සහ

(ආ) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් දරන ලද සියලු වියදම් පිළිබඳ වාර්තාවක්,

(3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ බලධරයන් වෙත භාරදෙනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) මේ වගන්තියේ කාර්ය සඳහා "එම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විමසීම් ආඥා පනත යටතේ පවත්වන ලද මැතිවරණයක්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යටතේ පවත්වන ලද මැතිවරණයක් සම්බන්ධයෙන් වන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පිළිබඳ පනත යටතේ පවත්වන ලද මැතිවරණයක්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති වාර්තා පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 19 වැනි පේළිය සහ 20 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 28 වැනි පේළිය සහ 29 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර පුවත්පත්වල, වාර සඟරාවල, සමාජ මාධ්‍යවල, ඩිජිටල් පුවරු හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයක,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඈ) ඒ මැතිවරණයට අදාළ රැස්වීම්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 5 වැනි පේළිය සහ 6 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කුලියට ගැනීම සඳහා වන වියදම් හැර ඒ මැතිවරණයට අදාළ කටයුතු සඳහා වාහන කුලියට";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ද ඇතුළුව පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් දරන ලද වියදම්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 14 වැනි පේළිය සහ 15 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එසේ වුව ද, පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් -

(අ) මැතිවරණය පැවැත්වෙන ප්‍රදේශය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(6) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තා අවස්ථාවෝචිත පරිදි, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා, ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා හෝ අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතු අතර, ඒ වාර්තාවල තොරතුරු පිළිගත් දේශපාලන පක්ෂයේ, ස්වාධීන කණ්ඩායමේ හෝ අපේක්ෂකයාගේ දැනීමේ හැටියට සත්‍ය සහ නිවැරදි බවට පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා, ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා හෝ අපේක්ෂකයා විසින් අත්සන් කර සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයකින් සමන්විත විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 28 වැනි පේළිය සහ 29 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර පුවත්පත්වල, වාර සඟරාවල, සමාජ මාධ්‍යවල, ඩිජිටල් ප්‍රදර්ශන පුවරු හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයක"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"7. (1) 6 වන වගන්තිය යටතේ භාරදෙන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මැතිවරණයක් සම්බන්ධයෙන් වන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"දැන්වීමේ නම් සඳහන් පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් භාරදෙන ලද වාර්තා";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''භාෂාවලින් අවම වශයෙන් එක් ජාතික පුවත්පතකවත් දැන්වීමක් පළකිරීමට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 15 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉකුත්වීමෙන් පසුව දින දහයක් ඇතුළත පළ කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''සඳහන් ස්ථානයේ දී, සහ ඒ වේලාවේ දී පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් විසින්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 23 වැනි පේළියේ සිට 27 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 29 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පවත්වනු ලබන මැතිවරණයක දී -'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සෑම අපේක්ෂකයකු ම, ඒ මැතිවරණය පවත්වන'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 13 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> “ “පරිපාලන දිස්ත්‍රික්කය” යන්නෙන් (392 වන අධිකාරය වූ) පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ පිහිටුවා ඇති පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ;”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> “පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආද්ශ කිරීමට:—

> “කැමැත්ත මත ඍජුව හෝ වක්‍රව පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 18 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> “ “මැතිවරණය” යන්නෙන් -
>
> (අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක්;
>
> (ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක්;
>
> (ඇ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක්; සහ
>
> (ඇ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක්,
>
> අදහස් වේ.”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය සභා සම්මත විය.

නව වගන්තිය

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්:25 වැනි පේළියෙන් ඉක්බිතිවම, 10 වැනි වගන්තිය ලෙස පහත සඳහන් පාඨය ඇතුළත් කිරීමට:—

"මෙම පනත බලාත්මක කිරීමට පෙර නාමයෝජනා කැඳවා ඇති මැතිවරණ සඳහා මෙම පනතේ විධිවිධාන අදාළ නොවේ."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්:10 වැනි වගන්තිය 11 වැනි වගන්තිය ලෙස නැවත අංකගත කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ප්‍රඥප්ති වගන්තිය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දීර්ඝ නාමය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: දීර්ඝ නාමය පහත පරිදි සංශෝධන කිරීමට:—

"සෑම ඡන්ද විමසීමක ම හෝ මැතිවරණයක ම අපේක්ෂකයන් විසින් දරනු ලබන" යන වචන වෙනුවට "සෑම මැතිවරණයක ම පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන් විසින් දරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නාමය

"නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 97; විරුද්ධව 36; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය තිස්තුන්දෙනෙකු (133) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Douglas Devananda | Yes |
| G 002. Nimal Siripala De Silva | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 004. Mahinda Rajapaksa | Yes |
| G 005. Prasanna Ranatunga | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Bandula Gunawardana | Yes |
| G 010. Keheliya Rambukwella | Yes |
| G 012. Wijeyadasa Rajapakshe | Yes |
| G 014. Ramesh Pathirana | Yes |
| G 016. Vidura Wickramanayaka | Yes |
| G 017. Kanchana Wijesekera | Yes |
| G 018. Naseer Ahamed | Yes |
| G 020. Tiran Alles | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 024. Jagath Pushpakumara | Yes |
| G 025. Ranjith Siyambalapitiya | Yes |
| G 026. Dilum Amunugama | Yes |
| G 027. Mohan Priyadarshana De Silva | Yes |
| G 028. Janaka Wakkumbura | Yes |
| G 029. Shehan Semasinghe | Yes |
| G 030. Kanaka Herath | Yes |
| G 031. Thenuka Vidanagamage | Yes |
| G 032. Premitha Bandara Tennakoon | Yes |
| G 033. Lasantha Alagiyawanna | Yes |
| G 034. Rohana Dissanayaka | Yes |
| G 036. Arundika Fernando | Yes |
| G 037. Vijitha Berugoda | Yes |
| G 038. Lohan Ratwaththe | Yes |
| G 039. Sanath Nishantha | Yes |
| G 040. Tharaka Balasuriya | Yes |
| G 041. Indika Anuruddha Herath | Yes |
| G 042. Siripala Gamalath | Yes |

| | |
|---|---|
| G 043. Anuradha Jayaratne | Yes |
| G 044. S. Viyalanderan | Yes |
| G 045. D. V. Chanaka | Yes |
| G 046. Sisira Jayakody | Yes |
| G 047. Piyal Nishantha De Silva | Yes |
| G 049. D. B. Herath | Yes |
| G 050. Shasheendra Rajapaksa | Yes |
| G 052. Shantha Bandara | Yes |
| G 053. K. Kader Masthan | Yes |
| G 054. Ashoka Priyantha | Yes |
| G 057. Suren Raghavan | Yes |
| G 058. Diana Gamage | Yes |
| G 060. Chamara Sampath Dasanayake | Yes |
| G 061. Anupa Pasqual | Yes |
| G 062. Johnston Fernando | Yes |
| G 064. Pavithradevi Wanniarachchi | Yes |
| G 066. Wajira Abeywardena | Yes |
| G 067. Janaka Bandara Thennakoon | Yes |
| G 068. C. B. Rathnayake | Yes |
| G 069. S. M. Chandrasena | Yes |
| G 070. Mahindananda Aluthgamage | Yes |
| G 071. Rohitha Abeygunawardhana | Yes |
| G 072. Namal Rajapaksa | Yes |
| G 073. Sarath Weerasekera | Yes |
| G 076. Kapila Athukorala | Yes |
| G 077. Gayashan Nawananda | Yes |
| G 079. Jayantha Ketagoda | Yes |
| G 080. Sampath Athukorala | Yes |
| G 082. U. K. Sumith Udukumbura | Yes |
| G 083. Pradeep Undugoda | Yes |
| G 084. Sanjeeva Edirimanna | Yes |
| G 085. Akila Ellawala | Yes |
| G 086. Jagath Kumara Sumithraarachchi | Yes |
| G 087. Karunadasa Kodithuwakku | Yes |

| | |
|---|---|
| G 088. Nalaka Bandara Kottegoda | Yes |
| G 089. Udayakantha Gunathilaka | Yes |
| G 090. Kokila Gunawardene | Yes |
| G 091. Milan Jayathilake | Yes |
| G 092. Kulasingam Dhileeban | Yes |
| G 093. Sudarshana Denipitiya | Yes |
| G 094. Isuru Dodangoda | Yes |
| G 095. Premnath C. Dolawatte | Yes |
| G 096. H. Nandasena | Yes |
| G 097. Muditha Prishanthi | Yes |
| G 098. Sudath Manjula | Yes |
| G 099. Mayadunna Chinthaka Amal | Yes |
| G 101. Kumarasiri Rathnayaka | Yes |
| G 102. Gunathilaka Rajapaksha | Yes |
| G 103. Upul Mahendra Rajapaksha | Yes |
| G 104. Rajika Wickramasinghe | Yes |
| G 105. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 106. Madhura Withanage | Yes |
| G 108. Samanpriya Herath | Yes |
| G 109. Sagara Kariyawasam | Yes |
| G 110. Yadamini Gunawardena | Yes |
| G 111. Manjula Dissanayake | Yes |
| G 112. Ranjith Bandara | Yes |
| G 114. Marjan Faleel | Yes |
| G 115. Lalith Varna Kumara | Yes |
| G 116. S. Jagath Samarawickrama | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 015. G.L. Peiris | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. A. L. M. Athaullah | Yes |

| | |
|---|---|
| O 022. Thalatha Athukorala | No |
| O 024. Sarath Fonseka | No |
| O 025. Harsha De Silva | No |
| O 027. Dilip Wedaarachchi | No |
| O 029. Niroshan Perera | No |
| O 030. Eran Wickramaratne | No |
| O 031. J. C. Alawathuwala | No |
| O 033. John Seneviratne | Yes |
| O 036. Dullas Alahapperuma | No |
| O 037. Vijitha Herath | No |
| O 043. Ashok Abeysinghe | No |
| O 045. Ajith Mannapperuma | No |
| O 049. Hector Appuhamy | No |
| O 052. Kavinda Heshan Jayawardhana | No |
| O 057. Harini Amarasuriya | No |
| O 062. K. Sujith Sanjaya Perera | No |
| O 063. S. M. Marikkar | No |
| O 064. Imran Maharoof | No |
| O 065. Ishak Rahuman | No |
| O 066. Mujibur Rahuman | No |
| O 067. Harshana Rajakaruna | No |
| O 068. Rohini Kumari Wijerathna | No |
| O 069. Chaminda Wijesiri | No |
| O 070. Waruna Liyanage | No |
| O 075. Chandima Weerakkody | No |
| O 081. W. H. M. Dharmasena | No |
| O 082. Kins Nelson | No |
| O 083. Rohana Bandara | No |
| O 089. Nimal Lanza | Yes |
| O 092. B. Y. G. Rathnasekara | No |
| O 108. Weerasumana Weerasinghe | No |

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකරයෙන් තුන්වැනිවර කියවා සහා සම්මත කරන ලදී.

**4. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2023 ජනවාරි 17 දිනැති අංක 2315/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2023.01.18 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. 2019 නොවැම්බර් සිට මේ දක්වා රටේ ආර්ථිකයේ පසුබෑම පිළිබඳ සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු ගයන්ත කරුණාතිලක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,—මෙරට ආර්ථිකය මේ වනවිට පෙර නොවූ විරූ දරුණු අර්බුදයකට ලක්ව ඇති බැවින් එම තත්ත්වයට වගකිවයුත්තන් පිළිබඳව විමර්ශනය කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය සතු පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින් ද;

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 64(2), 65 සහ 68(1) වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයා වෙත ලබාදිය යුතු ජීවන වියදම, උද්ධමනය, මුදල් සැපයුම සහ ජාත්‍යන්තර ගෙවුම් ශේෂය ඇතුළු ආර්ථික දර්ශක පිළිබඳ පුරෝකථන සහිත විශ්ලේෂණාත්මක වාර්තා ලබා නොදීමෙන් හෝ අමාත්‍ය මණ්ඩලය හෝ නිලධාරීන් විසින් සිය වගකීම් පැහැර හැරීමෙන් මෙම ආර්ථික අපරාධය සැලසුම් සහගතව සිදු කළා ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින් ද; සහ

බදු සහන ලබා දීම, ණය වාරික නොගෙවා සිටීම, ආනයන සීමා පැනවීම, රුපියල සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීමට ඉඩ සැලසීම, නිල සංක්‍රමණික ප්‍රේෂණ පහත වැටීම, රටේ උද්ධමනය අධි උද්ධමන තත්ත්වයක් දක්වා වැඩිවීම සහ ජීවන වියදම වැඩිවීම මෙරට ආර්ථික පරිහානියට හේතු වූ හෙයින් ද;

(අ) මෙතෙක් මුහුණ නොදුන් ආර්ථික අර්බුදයකට රට මුහුණ දීම, ඒ සම්බන්ධයෙන් අදාළ කාලසීමාවන්හි වගකීම් දරන ලද පුද්ගලයන් තම කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ද යන්නත්;

(ආ) ආර්ථික අර්බුදයේ බලපෑම වැළැක්වීමට සහ/හෝ අවම කිරීමට අදාළ බලධාරීන් ප්‍රමාණවත් පියවර ගත්තේ ද යන්නත්;

(ඇ) ආර්ථික අර්බුදයේ බලපෑම වැළැක්වීමට සහ/හෝ අවම කිරීමට නොහැකි වීමට හේතු වූ රාජ්‍ය යාන්ත්‍රණයේ අඩුපාඩු තිබුණේ ද යන්නත්;

(ඈ) එවැනි ආර්ථික අර්බුදවලට මුහුණ දීමට දායක වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්;

(ඉ) අනාගතයේ දී එවැනි ආර්ථික අර්බුදවලට රට පත් වීමට දායක වන්නා වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්; සහ

(ඊ) අනාගතයේ දී එවැනි ආර්ථික පරිහානි අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද යන්නත්

සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ)කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන් ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. **ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේ ද යන්න සොයා බැලීමටත්, එසේ නම්, ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්; හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු ගයන්ත කරුණාතිලක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව, —එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩිවෙමින් පවතින බව දෙවැනි වරටත් දන්වා ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ සැබෑ ළමා මන්දපෝෂණ තත්ත්වය සම්බන්ධව විවිධ වූ වෙනස් මත සහ සංඛ්‍යාලේඛන ඉදිරිපත් වන හෙයින් ද;

උග්‍ර මන්දපෝෂණ තත්ත්වයට පත්ව ඇති ළමුන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පවතින බව බොහෝ ප්‍රදේශවලින් වාර්තා වන හෙයින් ද;

දීර්ඝ කාලීන මන්දපෝෂණ තත්ත්වයක් පැවතීම හේතුවෙන් අනාගත දරු පරපුරේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සමාජ සංවර්ධනයට බරපතල බලපෑම් ඇති කළ හැකි හෙයින් ද;

ඉදිරි කාලය තුළදී තවත් ළමයින් ලක්ෂ 22 ක් මන්දපෝෂණ තත්ත්වයට පත්වීමට ඉඩ පවතින බවට වාර්තා පළවී ඇති හෙයින් ද;

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් නිකුත් කර ඇති වාර්තාවේ ඇතුළත් තොරතුරු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු හෙයින් ද;

ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේ ද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්, හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව

අධීක්ෂණය කිරීම සඳහාත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් එහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල කුමක් සඳහන් වුව ද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසි එක් දෙනෙකුට (21) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතු ය.

4.කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම (තරඟ විභාගයක් මඟින් උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම):** ‘‘මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය’’යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

“ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය’’යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 5.44 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන් අ.භා. 6.10 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරිය විසින් අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 ජනවාරි 20 සිකුරාදා පෙ.ව.9.30 වනතෙක් කල් ගියේය.